

සරණ මංගල්‍යයෙන් පසු සිදුහත් කුමරු යශෝධරා කුමරිය කිඹුල්වත්පුරයට කැඳවාගෙන යෑම

## ❈ සිවු පිරිසුදු සිල්

– රූකඩහේනේ චන්දජෝති නාහිමි

බෞද්ධ විමුක්ති ප්‍රතිපදාවේ සීලයට ලැබෙන ප්‍රමුඛතාව. පුද්ගල විමුක්තිය සැලසීමෙහි ලා අවශ්‍ය මානසික වෙනස ඇති කිරීම සඳහා අත්‍යවශ්‍ය මනෝ විද්‍යාත්මක වටිනාකමකින් යුතු ප්‍රතිපදාවක් ලෙස සීලයෙහි ඇති අගය සහ එහි ප්‍රභේද පිළිබඳ විස්තරයකි.

## ❈ දෙලොව දියුණුවට ආචාර ධර්ම කියන මංගල සූත්‍රය

– අගලකඩ සිරිසුමන හිමි

මංගල සූත්‍රයෙහි දැක්වෙන පුද්ගල ප්‍රගතියට හේතු වන පිළිවෙත් කිහිපයක් පිළිබඳ දෙසුමකට අර්ථකථනයක්, පොහෝද ධර්ම දේශනාවෙන්. ගුණ නුවණින් බාලයන් ඇසුරු නොකිරීම – ගුණ නුවණින් වැඩුණු අය ඇසුරු කිරීම – පිදිය යුත්තන් පිදීම යන කරුණු මෙලොවද – පරලොවද දියුණුවට හේතු වන අයුරු.

## ❈ ප්‍රඥාව ස්මතු කරවන බුදු සමය මානව වර්ගයාගේ විමුක්තියයි

– මඩුළුගිරියේ විජේරත්න

ආගම යනු කුමක්ද? ප්‍රඥාව යනු කුමක්ද? යන ප්‍රශ්නවලට පිළිතුරු සෙවීම තුළින් මිනිසාගේ විමුක්තියට අවශ්‍ය ප්‍රඥාව ලබා දෙන බෞද්ධ දර්ශනයෙහි වටිනාකම පැහැදිලි කිරීමට දරන උත්සාහයක් හැටියට මෙම ලිපිය හැඳින්විය හැකිය.

## ❈ වහළ සිදුරු වුවොත් ජලය ඇතුළු වන බව සිතන්න

– දිවියාගහ යසස්සි නාහිමි

සීලයෙන් සහ භාවනාවෙන් විධිමත් ලෙස සකස් නොකළ සිතක් තුළ රාගා’දී අනේක විධ ක්ලේශ ධර්ම පහළ වන ආකාරය. නිවන් මගට මෙන්ම සාමාජික ජීවිතයේ සාර්ථකත්වය උදෙසා ද – දූෂ්ට හැඟීම් සහ සිතිවිලි වලින් සිත රැක ගැනීමේ වැදගත්කම සහ ඒ සඳහා වූ ධර්මානුකූල උපාය මාර්ග.

## ❈ ප්‍රීතිමත් ගෘහ ජීවිතයක් සඳහා වූ ආචාර විද්‍යාව

– අනගාරික ධර්මපාල

බුදු සසුනෙහි පැවැත්මට විවිධ බාධක එළැඹුණු යුගයක එහි චිර පැවැත්ම වෙනුවෙන් සුවිශාල සේවයක් ඉටු කළ පුද්ගලයකු සේ සැලකෙන අනගාරික ධර්මපාලතුමන්ගේ ජන්ම දින සංවත්සරය නිමිත්තෙන් එතුමාට උපහාරයක් වශයෙන් පළවන, එතුමා ලියූ ලිපියකි. නිවන් අරමුණ මුල්කර ගත් ගිහියාගේ – විවාහය ඇතුළු ලෞකික දිවිය – නිරවුල් ලෙස – ප්‍රීතිමත් ලෙස සකස් විය යුතු අන්දම පිළිබඳ විග්‍රහයකි.

## ❈ Happiness through meditation

*-Ven. Piyadassi Maha thera*

## ෴ බල චක්‍රය – ධර්ම චක්‍ර පදනමෙහි කරකැවීම බෞද්ධ දේශපාලන ධර්මතාවයි

– මහාචාර්ය කේ.ඇන්. ජයතිලක

රටක – රාජ්‍යයක දියුණුව සඳහා – සමාජ අභිවෘද්ධිය සඳහා ධර්මය ගුරු කොට ගත් – ධර්මය පෙරටු කොට ගත් පාලන තන්ත්‍රයක අවශ්‍යතාව. දශ රාජ ධර්ම ඇතුළු රාජ්‍ය පාලනය සඳහා දේශිත ධාර්මික සංකල්පවල ප්‍රයෝගිකත්වය සහ ඵලදායකත්වය.

## ෴ සතර මහා භූතයෝ

– පිටිදූවේ සිරිධම්ම හිමි

බුදු දහමේ දැක්වෙන – 'සතර මහා භූත' නමින් හැඳින්වෙන – ලෝකය නිර්මාණය වී ඇති මූල ධාතු සතර පාඨකයාට පැහැදිලි කිරීමට දරන උත්සාහයකි. නූතන විද්‍යා පර්යේෂණ වලින් හෙළි වී ඇති 'මූල ද්‍රව්‍ය' පිළිබඳ කරුණු සමග මේ ඉගැන්වීම තුලනාත්මක ලෙස අධ්‍යයනය කිරීමට දරන උත්සාහයක් හැටියට ද මෙම ලිපිය හැඳින්විය හැකි ය.

## ෴ නිරෝගී බව දායාද කරන 'පතිරූප දේශ වාසය'

–තෙළඟපාත ධර්මකීර්ති නාහිමි

තමන්ට සුදුසු, පවිත්‍ර, හිතකාමී පරිසරයක ජීවත්වීමේ වැදගත්කම පිළිබඳ ගැඹුරු වූද, සංකීර්ණ වූද බුද්ධ දේශනාවකට අර්ථකථනයක් හැටියට – මේ ලිපිය හැඳින්විය හැකිය. පුද්ගලයාගේ යහපත් කායික – මානසික සෞඛ්‍යය ගොඩ නංවා – ඔහු නිවන් මගට අවතීර්ණ කරවීමේ ප්‍රධාන සාධකයක් හැටියටයි, 'පතිරූප දේස වාස' සංකල්පය දේශනා කර ඇත්තේ.

## ෴ බුදුපියාණන් වදාළ පරිදිම ඔබ ද දිය සුළියට හසුව ඇත

– ගොඩගම චන්ද්‍රදස්සී තෙරණිය

සත්වයා සසර බන්ධනයට හසු වී සිටින ආකාරය – විවිධ විචිත්‍ර උපමා රූසකින් පැහැදිලි කෙරෙන බුද්ධ දේශනාවක් පිළිබඳ විමර්ශනයක් හැටියට මෙම ලිපිය හැඳින්විය හැකිය. ඉඳුරන් මගින් ලබන කාමාශ්වාද ඇතුළු විවිධ මානසික 'දිය සුළි' වලට හසු වී පුද්ගලයා – කෙළවරක් නැති සසරක දුක් විඳින ආකාරයයි, මෙම ලිපියෙන් පැහැදිලි කැරෙන්නේ.

## ෴ බුදුරුව ගල

– නිර්මලා අමරසිංහ

'වැනැසී යන බෞද්ධ උරුමය' විශේෂාංගය යටතේ ශ්‍රී ලංකාවේ ඉපැරැණි සුප්‍රකට කළු ගලෙන් නෙළූ සුවිශාල බුදුරුවක් සහිත පූදබිමක් පිළිබඳ විස්තරයකි. මොණරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 'බුදුරුවගල' නම් ග්‍රාමයෙහි පිහිටි මෙම පූද බිමෙහි ඓතිහාසික – ආගමික හා කලාත්මක වටිනාකම හෙළිදරව් කිරීමට මෙම ලේඛකයා උත්සාහ කර ඇති බව පෙනේ.

## ෴ අට ලෝ දහමෙන් කම්පා නොවෙමු කීර්තිය විදහාපාන කැඩපත නින්දාවයි

– කෝමාරිකේ රාහුල හිමි

'අට ලෝ දහම' නමැති බෞද්ධ ඉගැන්වීමෙන් පැහැදිලි වන – සියලු ලෝක සත්වයන්ට පොදු ධර්මතා අට අතරින් – 'නින්ද – ප්‍රශංසා' නමැති ලෝ දහම් දෙක පිළිබඳ ඉදිරිපත් කැරෙන විවරණයකි. නින්දවේ දී කම්පා වන – වේදනාවට පත් වන පුද්ගලයන් ඉලක්ක කරගෙන විශේෂයෙන් ලියැවුණු ලිපියක් ලෙස – මෙය සැලකිය හැකිය.

## ෴ මන්තානි පුත්ත පුණ්ණ මහ රහතන් වහන්සේ

– මාදම්පේ සරණතිස්ස නාහිමි

'ශ්‍රාවක චරිත' විශේෂාංගය යටතේ බුදුරදුන්ගේ ප්‍රධාන ශ්‍රාවක හිමිවරුන් අසූ නම අතරින් එක් අයකු වූ – බුදු සසුනේ 'අග්‍ර ධර්ම කථිකයන් වහන්සේ' ලෙස තනතුරු ලද මහා ශ්‍රාවක හිමි නමකගේ සුවිශේෂ චරිතාංග පිළිබඳ විස්තරයකි.

## ෴ ඕලන්ද ජාතික කිතුනු කතක් වූ මරුජා බේඩ් බුදු දහමේ අගය දකී

– නෙම්සිරි මුතුකුමාර

පසුගිය වෙසක් මාසයේ තායිලන්තයේ උපාසිකාරාමයට ගොස් ලද අත්දැකීම් හමුවේ – තමන්ගේ ජීවන දර්ශනය වෙනස් කරගත් ඕලන්ද ජාතික කිතුනු කාන්තාවක් බුදු දහම පිළිබඳ පවසන අදහස්.